# සමථයකට පත් කරන ලද මුද්දර ගාස්තු පිළිබඳ ප්‍රකාශනය සම්පූර්ණ කිරීම සඳහා උපදෙස්

මෙම ප්‍රකාශනය සම්පූර්ණ කිරීමට පෙර උපදෙස් මාලාව සුපරීක්ෂාකාරීව කියවන ලෙසට තරයේ උපදෙස් දෙනු ලැබේ. ප්‍රකාශනය භාරදීම ඊ - සේවාව හරහා හෝ මුද්‍රිත පිටපත භාරදීම මගින් සිදු කළ හැකිය.

## ඊ- සේවාව මගින් ගොනු කිරීම

දේශීය ආදායම් දෙපරේතමේන්තු වෙබ් අඩවිය මගින් ගොනු කිරීමේ පහසුකම් සලසා ඇත.

www.ird.gov.lk → ඊ- සේවා → ඊ- සේවා වෙත පිවිසීම

ඊ - සේවා පිළිබඳ ඉක්මන් මාර්ගෝපදේශයන් දේශීය ආදායම් දෙපරේතමේන්තු වෙබ් අඩවියට පිවිසීමෙන් ලබා ගත හැකිය.

## ඊ - සේවාව භාවිතා කර කාලය සහ පිරිවැය ඉතිරි කරගන්න

ඔබ දැනටමත් ඊ -සේවාව භාවිතා කරන්නෙකු නම් මුද්දර ගාස්තු සඳහා, මුද්දර ගාස්තු බදු වර්ගය සක්‍රිය කිරීම කළ යුතු වේ. එසේ නොවේ නම්, ඊ - සේවා භාවිතා කිරීම සඳහා පෞද්ගලික හැඳුනුම් අංකයක් (PIN) සඳහා ඉල්ලුම් කළ හැකිය.

(https://eservices.ird.gov.lk/Registration/PINRequest/ShowPINRequestDetail )

## මුද්‍රිත පිටපත ගොනු කිරීම

## එවිය යුතු ලිපිනය

**දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්**
**මධ්‍යම ලේඛන කළමනාකරණ අංශය**
**දේශීය ආදායම් දෙපාර්තමේන්තුව**
**ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත**
**කොළඹ 02**

සළකනු ලබන යම්කිසි කාලපරිච්ඡේදයකට අදාළ වන එක් එක් ප්‍රකාශනය සඳහා තීරු කේතය (Barcode) සුවිශේෂී වේ. එහෙයින් ගොනු කිරීමේ කාර්යයන් සඳහා , දේශීය ආදායම් දෙපරේතමේන්තුව විසින් එවා ඇති මුල් ප්‍රකාශනයම භාවිතා කළ යුතුය. මුල් ප්‍රකාශනය අස්ථානගත වූ අවස්ථාවක දී කරුණාකර දේශීය ආදායම් දෙපාරේතමේන්තුවේ " ව්‍යාපාර උපදේශන ඒකකය " හා සම්බන්ධ වන්න.

පළමු පිටුවේ ඇති බදු ගෙවන්නාගේ සුවිශේෂී තොරතුරු සහ කාලපරිච්ඡේද පිළිබඳව දැනුවත් වන ලෙසට මෙයින් ඔබට උපදෙස් දෙනු ලැබේ. ඒවා නම් ;

- බදු ගෙවන්නා හඳුනාගැනීමේ අංකය
- නම සහ ලිපිනය
- කාලපරිච්ඡේදය - ප්‍රකාශනයේ කාල කේතය

  උදා: 2022.03.31 දිනෙන් අවසන් වන කාර්තුව සඳහා - 2210
  2022.06.30 දිනෙන් අවසන් වන කාර්තුව සඳහා - 2220
  2022.09.30 දිනෙන් අවසන් වන කාර්තුව සඳහා - 2230
  2022.12.31 දිනෙන් අවසන් වන කාර්තුව සඳහා - 2240
- නියමිත දිනය
- පද්ධතිය මගින් ජනනය කරනු ලැබූ තීරු කේත අංකය.

## ප්‍රකාශනය කොටස් හතරකින් සමන්විතය ;

1. 1 වන කොටස - මුද්දර ගාස්තු බැදියාවට යටත් සාධන පත්‍ර
2. 2 වන කොටස - මුද්දර ගාස්තු නිදහස් කරන ලද සාධන පත්‍ර
3. 3 වන කොටස - ගෙවීම් සම්බන්ධ තොරතුරු
4. 4 වන කොටස - ප්‍රකාශය

## 1 වන කොටස - මුද්දර ගාස්තු ගෙවිය යුතු සාධන පත්‍ර

මුද්දර ගාස්තු ගෙවිය යුතු සාධන පත්‍ර සහ අදාළ වන බදු අනුප්‍රමාණයන් පිළිබඳව අංක 1465/19 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය හා ඒ හා සම්බන්ධ සංශෝධනයන් බලන්න.

**පවතින මුද්දර ගාස්තු අනුපාතයන් ඇතුලත් ලැයිස්තුව මෙම මාර්ගෝපදේශය අවසානයේ ඇමුණුම I හි සඳහන්ව ඇත.**

**ප්‍රකාශනයේ 101 වන තීරුව යටතේ විශේෂිත සාධන පත්‍ර වර්ග ලැයිස්තු ගත කර ඇත**.

ඔබ විසින් සමථයකට පත් කරන ලද බැදියාවට යටත් සියළු සාධන පත්‍රවල විස්තර පහත සඳහන් පරිදි ඇතුලත් කරන්න.

i. 102 වන තීරුව - අදාළ කාලපරිච්ඡේදයේ දී නිකුත් කළ එක් එක් සාධන පත්‍ර සංඛ්‍යාව ඇතුළත් කරන්න.

ii. 103 වන තීරුව - අදාළ සාධන පත්‍රය යටතේ බැදියාවට යටත් සාධන පත්‍ර එක් එක් වර්ගයේ සමුච්චිත වටිනාකම ඇතුළත් කරන්න.

iii. 104 වන තීරුව - එක් එක් සාධන පත්‍ර වර්ග සඳහා සමථයකට පත්කළ මුද්දර ගාස්තුවල මුළු වටිනාකම ඇතුළත් කරන්න.

iv. 100 වන කොටුව-104 වන තීරුවේ සමථයකට පත්කළ මුළු මුද්දර ගාස්තුවල සමස්ථ වටිනාකම ඇතුළත් කරන්න.

## 2 වන කොටස - මුද්දර ගාස්තු නිදහස් කරන ලද සාධන පත්‍ර

නිදහස් කරන ලද සාධන පත්‍ර පිළිබඳව වැඩිදුර තොරතුරු සඳහා අංක 1465/20 දරන අති විශේෂ ගැසට් පත්‍රය හා ඒ හා සම්බන්ධ සංශෝධනයන් බලන්න.

**පවතින මුද්දර ගාස්තු නිදහස් කිරීම් ඇතුලත් ලැයිස්තුව මෙම මාර්ගෝපදේශය අවසානයේ ඇමුණුම II හි සඳහන්ව ඇත.**

**ප්‍රකාශනයේ 201 වන තීරුව යටතේ විශේෂිත සාධන පත්‍ර වර්ග ලැයිස්තු ගත කර ඇත**

නිදහස් කරන ලද සාධන පත්‍ර වේ නම්, ඒ පිළිබඳ විස්තර පහත තීරුවල ඇතුළත් කරන්න.

i. 202 වන තීරුව - නිකුත් කළ එක් එක් සාධන පත්‍ර සංඛ්‍යාව අදාළ සාධන පත්‍රය යටතේ ඇතුළත් කරන්න.

ii. 203 වන තීරුව - නිදහස් කරන ලද එක් එක් සාධන පත්‍ර වර්ගවල සමුච්චිත වටිනාකම අදාළ සාධන පත්‍රය යටතේ ඇතුළත් කරන්න.

## 3 වන කොටස - ගෙවීම් සම්බන්ධ තොරතුරු

**ගෙවීම් ප්‍රමාදවීම වළක්වා ගැනීම සහ චෙක්පත් කල් ඉකුත් වීම වළක්වා ගැනීම සඳහා ලංකා බැංකුව මගින් ගෙවීම් කරන්න.**

දේශීය ආදායම් දෙපරේතමේන්තුව විසින් කාර්තුව සඳහන්කර නිකුත් කර ඇති පූර්ව මුද්‍රිත ගෙවීම් පත්‍රිකා, එකී කාර්තුව සඳහා මුද්දර ගාස්තු බැදියාව නිරවුල් කිරීමට භාවිතා කරන්න. පූර්ව මුද්‍රිත ගෙවීම් පත්‍රිකා නොමැති අවස්ථාවක දී නිවැරදි ගෙවීම් කාලපරිච්ඡේද කේතය සහ බදු වර්ග කේතය '60' ඇතුළත් කරන ලෙසට උපදෙස් දෙනු ලැබේ.

කාලපරිච්ඡේද කේත :- 2022.03.31 වන දිනෙන් අවසන් වන කාර්තුව සඳහා - **22030**

2022.06.30 වන දිනෙන් අවසන් වන කාර්තුව සඳහා - **22060**

2022.09.30 වන දිනෙන් අවසන් වන කාර්තුව සඳහා - **22090**

2022.12.31 වන දිනෙන් අවසන් වන කාර්තුව සඳහා - **22120**

**මුද්දර බදු ගෙවීම සඳහා මාර්ගස්ථ බදු ගෙවීමේ ක්‍රමය ද භාවිතා කළ හැකිය.**

වැඩි විස්තර සඳහා www.ird.gov.lk වෙබ් අඩවියට පිවිස 2021 පෙබරවාරි 8 වන දිනැති අංක PN/PMT/2021-01 දරන නිවේදනය හා 2021 ජූනි 8 වන දිනැති අංක PN/PMT/2021-04 දරන නිවේදනය පරිශීලනය කරන්න.

## 4 වන කොටස - ප්‍රකාශය

ප්‍රකාශනයෙහි අවසානයේ ඉල්ලා ඇති, ප්‍රකාශකරු පිළිබඳ විස්තර බලයලත් නිලධාරියාගේ අත්සන සහ නිලමුද්‍රාව සහිතව පැහැදිලිව ඇතුලත් කරන්න.

**ප්‍රකාශකරුගේ අත්සන රහිත වීම** ප්‍රකාශනය නොලැබුණා ලෙස සැලකීමට හේතුවන බව කරුණාවෙන් සලකන්න.

**සටහන -වැරදි ප්‍රකාශනයක් සැපයීම, නියමිත දිනට ප්‍රකාශනයක් ඉදිරිපත් කිරීමට පියවර නොගැනීම හෝ නියමිත දිනට බදු නොගෙවීම හේතුවෙන් යම් තැනැත්තෙකු මත දණ්ඩන පැනවෙනු ඇත.**

**සටහන** - පහත සඳහන් පරිදි එක් එක් කාලපරිච්ඡේද සඳහා මුද්දර ගාස්තුවට යටත් සහ මුද්දර ගාස්තුවෙන් නිදහස් කරන ලද සාධන පත්‍ර සඳහා වෙන වෙනම උපලේඛන භාවිතා කරන්න.

## උදාහරණ:

2022.03.31 වන දිනෙන් අවසන් වන කාර්තුව තුළ සීමාසහිත ABC සමාගම විසින් පහත සඳහන් සාධන පත්‍ර නිකුත් කර ඇත.

**1. රක්ෂණ ඔප්පු**

| අනුක්‍රමික අංකය | දිනය | ඔප්පු හිමියාගේ නම | සාධන පත්‍රයේ යොමු අංකය | ඔප්පුවේ ස්වභාවය | සාධන පත්‍රයේ මුළු වටිනාකම රු. | එකතු කළ මුද්දර ගාස්තු රු. |
|---|---|---|---|---|---|---|
| 1 | 2022.01.20 | ×××× | G123 | මෝටර් රථයක් සඳහා සාමාන්‍ය රක්ෂණය | 750,000.00 | 750.00 |
| 2* | 2022.02.05 | CCC | G124 | යන්ත්‍රයක් සඳහා සාමාන්‍ය රක්ෂණය | 125,000.00 | - |
| 3 | 2022.02.05 | YYYY | G125 | කැබ් රථයක් සඳහා සාමාන්‍ය රක්ෂණය | 135,000.00 | 135.00 |
| 4* | 2022.03.09 | ZZZZ | L1001 | ZZZZ මහතා සඳහා ජීවිත රක්ෂණය | 250,000.00 | - |
| 5 | 2022.03.22 | KKKKLtd | F2001 | KKKK Ltd සඳහා ගිනි රක්ෂණය | 75,000.00 | 75.00 |
| එකතුව | | | | | 1,210,000.00 | 960.00 |

2*, 4* - නිදහස් කළ රක්ෂණ ඔප්පු

**2. වැටුප් ලැබීම් - ජනවාරි මාසය**

| අනුක්‍රමික අංකය | දිනය | සේවා නියුක්තිකයාගේ අංකය | සේවා යෝජකයාගේ නම | දළ වැටුප් ප්‍රමාණය රු. | අඩු කළ මුද්දර ගාස්තු රු. |
|---|---|---|---|---|---|
| 1* | 2020.01.25 | 1001 | Aaaa | 25000.00 | - |
| 2 | 2020.01.25 | 1002 | bbbb | 35000.00 | 25.00 |
| 3* | 2020.01.25 | 1003 | Cccc | 15000.00 | - |

**වැටුප් ලැබීම් - පෙබරවාරි මාසය**

| අනුක්‍රමික අංකය | දිනය | සේවා නියුක්තිකයාගේ අංකය | සේවා යෝජකයාගේ නම | දළ වැටුප් ප්‍රමාණය රු. | අඩු කළ මුද්දර ගාස්තු රු. |
|---|---|---|---|---|---|
| 1* | 2020.02.25 | 1001 | Aaaa | 25000.00 | - |
| 2 | 2020.02.25 | 1002 | bbbb | 35000.00 | 25.00 |
| 3* | 2020.02.25 | 1003 | Cccc | 15000.00 | - |

**වැටුප් ලැබීම් - මාර්තු මාසය**

| අනුක්‍රමික අංකය | දිනය | සේවා නියුක්තිකයාගේ අංකය | සේවා යෝජකයාගේ නම | දළ වැටුප් ප්‍රමාණය රු. | අඩු කළ මුද්දර ගාස්තු රු. |
|---|---|---|---|---|---|
| 1* | 2020.03.25 | 1001 | Aaaa | 25000.00 | - |
| 2 | 2020.03.25 | 1002 | bbbb | 35000.00 | 25.00 |
| 3* | 2020.03.25 | 1003 | Cccc | 15000.00 | - |

**1*, 3* - නිදහස් කළ වැටුප් ලැබීම්**

## ප්‍රකාශනයේ 1 වන කොටස සහ 2 වන කොටස පහත පරිදි සම්පූර්ණ කළ යුතුය.

## 1 වන කොටස - මුද්දර ගාස්තු බැදියාවට යටත් සාධන පත්‍ර

| 101 | | 102 | 103 | | 104 | |
|---|---|---|---|---|---|---|
| විශේෂිත සාධන පත්‍ර වර්ගය | | සාධන පත්‍ර සංඛ්‍යාව | වටිනාකම | | මුද්දර ගාස්තු | |
| | | | රුපියල් | ශත | රුපියල්/ | ශත |
| A | රක්ෂණ ඔප්පු | 3 | 960000 | 00 | 960 | 00 |
| B.i | විදේශ මත්පැන් නොවන මත්පැන් බලපත්‍ර | | | | | |
| B.ii | විදේශ මත්පැන් බලපත්‍ර | | | | | |
| B.iii | නොතාරිස් බලපත්‍ර | | | | | |
| B.iv | වෙනත් බලපත්‍ර | | | | | |
| C | ක්‍රෙඩිට් කාඩ් ගනුදෙනු | | | | | |
| D | වැටුප් ලදුපත් | 3 | 1050000 | 00 | 75 | 00 |
| E | ලදුපත් හා නිදහස්කි රීම් | | | | | |
| F | බැඳුම්කර හා උකස්කර | | | | | |
| G | පොරොන්දු නෝට්ටු | | | | | |
| H | කල් බදු ,බදු කුලී හා කුලී | | | | | |
| I | වෙනත් | | | | | |
| මුද්දර ගාස්තු එකතුව | | | | 100 | 1035 | 00 |

## 2 වන කොටස - මුද්දර ගාස්තු නිදහස් කළ සාධන පත්‍ර

| 201 | | 202 | 203 | |
|---|---|---|---|---|
| විශේෂිත සාධන පත්‍ර වර්ගය | | සාධන පත්‍ර සංඛ්‍යාව | වටිනාකම | |
| | | | රුපියල් | ශත |
| A | රක්ෂණ ඔප්පු | 2 | 375000 | 00 |
| B.i | විදේශ මත්පැන් නොවන මත්පැන් බලපත්‍ර | | | |
| B.ii | විදේශ මත්පැන් බලපත්‍ර | | | |
| B.iii | නොතාරිස් බලපත්‍ර | | | |
| C | ක්‍රෙඩිට් කාඩ් ගනුදෙනු | | | |
| D | වැටුප් ලදුපත් | 6 | 120000 | 00 |
| E | ලදුපත් හා නිදහස් කිරීම් | | | |
| F | බැඳුම්කර හා උකස්කර | | | |
| G | පොරොන්දු නෝට්ටු | | | |
| H | කල් බදු ,බදු කුලී හා කුලී | | | |
| I | වෙනත් | | | |

## ඇමුණුම I

| අනු අංකය | සාධන පත්‍රය | | | අනුප්‍රමාණය (රු.) | අතිවිශේෂ ගැසට් පත්‍රය, දිනය සහ බලපැවැත්වෙන දිනය |
|---|---|---|---|---|---|
| 1. | යම් දිවුරුම් ප්‍රකාශයක් | | | **50.00** | 1809/19 (2013.05.10) 2013.05.13 වන දින සිට බලපැවැත්වෙන පරිදි |
| 2. | රක්ෂණ ඔප්පුවක්<br>ඔප්පුව මත ගෙවිය යුතු මුළු වාරික මුදලෙහි සෑම රු. 1,000 ක් හෝ ඉන් කොටසක් සඳහා | | | **1/-** | 1789/9 (2012.12.17) 2013.01.0113 වන දින සිට බලපැවැත්වෙන පරිදි |
| 3. | ප්‍රසිද්ධ නොතාරිස්වරයකු වශයෙන් කටයුතු කිරීමට බලපත්‍රය | | | **2,000/-** | 1789/9 (2012.12.17) 2013.01.01 වන දින සිට බලපැවැත්වෙන පරිදි |
| 4. | (අ) | මත්පැන් විකිනීමේ නිරත වෙළඳාමක් හෝ ව්‍යාපාරයක් හැර වෙනත් යම් වෙළඳාමක්, ව්‍යාපාරයක්, වෘත්තියක් හෝ ‍රැකියාවක් කරගෙන යාමට (බලපත්‍රෙය් සඳහන් ) යම් කාලපරිච්ඡේදයක් සඳහා නිකුත් කළ බලපත්‍රයක් | | 2,000/- හෝ බලප්‍ර ගාස්තුවෙන් 10% යන මේවායින් කවර හෝ අඩු අගය | 2104/5 (2018.12.31) 2019.01.01 වන දින සිට බලපැවැත්වෙන පරිදි |
| | (ආ) | (i) | රට බීම බලපත්‍ර (FL) සමඟ නිකුත් කරනු ලබන AFL1, AFL2, AFL3, AFL4 අරක්කු බලපත්‍ර සහ බෝතල් රා විකිණීම සඳහා නිකුත් කරනු ලබන බලපත්‍ර හැර<br><br>මත්පැන් විකිණීම සඳහා වූ යම් වෙළඳාමක් හෝ ව්‍යාපාරයක් කරගෙන යාමට බලපත්‍රයේ සඳහන් යම් කාලපරිච්ඡේදයක් සඳහා නිකුත් කළ බලපත්‍රයක් | 20,000/- | 2104/5 (2018.12.31) 2019.01.01 වන දින සිට බලපැවැත්වෙන පරිදි |
| | | (ii) | රට බීම බලපත්‍ර (FL) සමඟ නිකුත් කරනු ලබන AFL1, AFL2, AFL3, AFL4 අරක්කු බලපත්‍ර සහ බෝතල් රා විකිණීම සඳහා නිකුත් කරනු ලබන බලපත්‍ර | එක් එක් බලපත්‍රයකට රු. 2,000/- හෝ බලපත්‍ර ගාස්තුවෙන් 10% යන මේවායින් කවර හෝ වැඩි මුදල | 2104/5 (2018.12.31) 2019.01.01 වන දින සිට බලපැවැත්වෙන පරිදි |
| 5. | 2016 ජනවාරි 01 දිනට පසුව ආරම්භ වන කාල පරිච්ඡේදයක් තුළ ඇතුලත් වූ සෑම ණය කාඩ්පතක ගනුදෙනුවක් සම්බන්ධයෙන්,<br><br>එය යම් විදේශ ව්‍යවහාර මුදලකින් කාඩ්පතක් ඉදිරිපත් කරන හෝ ඉදිරිපත් නොකරන ගනුදෙනුවක් යන්න පිළිබඳව සැළකිල්ලට නොගෙන | | | එම මුදලෙහි සෑම රු. 1,000 හෝ ඉන් කොටසක් සඳහා<br><br>රු. 25/- | 1947/45 (2016.01.01) 2016.01.01 වන දින සිට බලපැවැත්වෙන පරිදි |

| | | | |
|---|---|---|---|
| | එහි වෙළඳ රට ( භාණ්ඩ හෝ සේවා මිලදී ගැනීම හෝ මුදල් ආපසු ගැනීම සිදුවන රට) ශ්‍රී ලංකාව නොවන වෙනත් රටක් වන අවස්ථාවකදී<br>ගෙවිය යුතු වන යම් මූල්‍ය හෝ සේවා ගාස්තු අඩංගු නොවන යම් මුදල් ප්‍රමාණයක් ගෙවීම සඳහා ඉදිරිපත් කරන ලද හිමිකම් පෑමක්, ඉල්ලීමක් හෝ අයදීමක් | | |
| 6. | යම් සමාගමක යම් කොටස් සංඛාවක් නිකුත් කිරීමක්, මාරුකිරීමක් හෝ පැවරීමක් මත නිකුත් කළ යම් කොටස් සහතිකයක්.<br><br>එවැනි කොටස් කල මුළු වටිනාකමෙහි සෑම රු. 1,000 ක් හෝ ඉන් කොටසක් සඳහා එවන් මාරු කිරීමක් හෝ පැවරීමක් නිකුත් කරන දිනට විවෘත වෙළඳපොළේ එවන් කොටස් සඳහා උපයාගත හැකි වනු ඇතැයි තක්සේරුකරු/ සහකාර කොමසාරිස්/ නියෝජ්‍ය කොමසාරිස්/ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස් නිගමනය කරනු ලබන වටිනාකම | රු. 5.00 | 1882/17 (2014.09.30)<br>2014.09.30 වන දින සිට බලපැවැත්වෙන පරිදි |
| 7. | යම් දේපලකට බලපාන යම් නිශ්චිත මුදල් ප්‍රමාණයක් සඳහා බැදීමක් (බැදුම්කරයක්) හෝ උකස් කිරීමක් එහි සෑම රු. 1,000 ක් හෝ ඉන් කොටසක් සඳහා | රු. 1.00 | 1933/14 (2015.09.21)<br>2015.09.21. වන දින සිට බලපැවැත්වෙන පරිදි |
| 8. | යම් පොරොන්දු නෝට්ටුවක්<br><br>එහි සෑම රු. 1,000 ක් හෝ ඉන් කොටසක් සඳහා | රු. 1.00 | 1465/19 (2006.10.05)<br>2006.10.05 වන දින සිට බලපැවැත්වෙන පරිදි |
| 9. | යම් දේපළක් බද්දට හෝ කුලියට දීමට අදාළ යම් සාධන පත්‍රයක් | | 1465/19 (2006.10.05)<br>2006.10.05 වන දින සිට බලපැවැත්වෙන පරිදි |
| | (අ) කල්බදු ගිවිසුම හෝ කුලී ගිවිසුම (කුලී සින්නක්කර ගිවිසුම හැරුණුකොට) සමන්විත මුළුකාලපරිච්ඡේදය සඳහා එකතු කල්බද්ද හෝ කුලිය<br><br>එහි සෑම රු. 1,000 හෝ ඉන් කොටසක් සඳහා | රු.10.00 | |
| | (ආ) 1982 අංක 29 දරන පාරිභෝගික ණය පනත යටතේ එළඹ ඇති කුලී සින්නක්කර ගිවිසුමක් යටතේ ගෙවිය යුතු මුළු වටිනාකමෙහි සෑම රු. 1,000 ක් හෝ ඉන් කොටසක් සඳහා | 10.00 | 1465/19 (2006.10.05)<br>2006.10.05 වන දින සිට බලපැවැත්වෙන පරිදි |
| 10. | යම් මුදලක් හෝ වෙනත් දේපළක් සඳහා දෙන ලද ලදුපතක් හෝ නිදහස් කිරීමක් | | 1530/13 (2008.01.01)<br>2008.01.01 වන දින සිට බලපැවැත්වෙන පරිදි |
| | (අ) රු. 25,000.00 ක් හෝ ඊට අඩු මුදල් ප්‍රමාණයක් මත | නිදහස් | |
| | (ආ) රු. 25,000.00 කට වැඩි වන මුදල් ප්‍රමාණයක් මත | රු. 25.00 | 1530/13 (2008.01.01)<br>2008.01.01 වන දින සිට බලපැවැත්වෙන පරිදි |

## ඇමුණුම II

| අනු අංකය | උපලේඛනය | අතිවිශේෂ ගැසට් පත්‍රය, දිනය සහ බලපැවැත්වෙන දිනය |
|---|---|---|
| 01. | යම් රජයේ නිලධාරියෙකුගේ ඉල්ලීම මත හෝ යම් ලිඛිත නීතියක් යටතේ පනවන ලද යම් නියමයකට අනුකූලව ඉදිරිපත් කරන ලද දිවුරුම් පෙත්සමක්; | 1465/20 (2006.10.05) 2006.10.06.දින සිට බලපැවැත්වේ |
| 02. | සිය රාජකාරි නිසි ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා යම් රාජ්‍ය නිලධාරියෙකු හෝ ඔහුගේ ඇපකරුවකු විසින් දෙන ලද බැඳුම්කරයක් හෝ උකසක්; | 1465/20 (2006.10.05) 2006.10.06.දින සිට බලපැවැත්වේ |
| 03. | 1982 අංක 43 දරන පනතේ 67(3) වගන්තිය යටතේ වන නියෝගය බලාත්මක වන යම් රටක රජයක් විසින් හෝ රජය වෙනුවෙන් හෝ රජය සඳහා ක්‍රියාත්මක කරන සාධන පත්‍රයක්; | 1465/20 (2006.10.05) 2006.10.06.දින සිට බලපැවැත්වේ |
| 04. | ආහාර භෝග හෝ ස්වර්ණාභරණ උකස් කිරීම සඳහා වූ යම් සාධන පත්‍රයක්; | 1465/20 (2006.10.05) 2006.10.06.දින සිට බලපැවැත්වේ |
| 05. | නැති වූ හෝ විනාශ වූ කොටස් සහතික පත්‍රයක් වෙනුවට හෝ දැනට තිබෙන කොටස් සහතික වෙනුවට, එහෙත් දැනට තිබෙන කොටස් සහතික වල වටිනාකම නොඉක්මවන , වැඩි හෝ අඩු කොටස් සංඛ්‍යාවක් සඳහා නිකුත් කරන ලද අළුත් කොටස් සහතිකයක්; | 1465/20 (2006.10.05) 2006.10.06.දින සිට බලපැවැත්වේ |
| 06. | යම් කොටසක් එක් තැනැත්තෙකු විසින් විකිණීම සහ තවත් තැනැත්තෙකු විසින් මිළයට ගැනීමට ආනුශංගිකව නිකුත් කරනු ලැබූ යම් කොටස් සහතිකයක්; එම විකිණීම හා මිලට ගැනීමට අදාලව, 2005 අංක 5 දරන මුදල් පනතේ II කොටස යටතේ කොටස් ගනුදෙනු බද්ද අය කරනු ලැබ ඇත්නම්; | 1465/20 (2006.10.05) 2006.10.06.දින සිට බලපැවැත්වේ |
| 07. | 1990 අංක 18 දරන පනතින් පිහිටුවන ලද ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශයේ යම් කොටසක් නිකුත් කිරීම, මාරු කිරීම හෝ පැවරීම සම්බන්ධයෙන් වන යම් කොටස් සහතිකයක්; | 1465/20 (2006.10.05) 2006.10.06.දින සිට බලපැවැත්වේ |

| | | |
|---|---|---|
| 07ඈ. | යම් තැනැත්තෙකු විසින් අන්තර් වෙළඳ ගිණුමකට (ස්ලෑෂ් ගිණුමකට) හෝ එවැනි ගිණුමක සිට යම් තැනැත්තෙකුට කොටස් පැවරීමේ යම් සාධන පත්‍රයක් | 1789/15 (2012.12.18) 2013.01.01.දින සිට බලපැවැත්වේ |
| 08. | 1987 අංක 12 දරන ගොවි විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රම පනතේ විධිවිධානවලට අනුකූලව ක්‍රියාත්මක කරන ලද සාධන පත්‍රයක්; | 1465/20 (2006.10.05) 2006.10.06.දින සිට බලපැවැත්වේ |
| 09. | 1972 අංක 05 දරන සමුපකාර සමිති නීතියේ අර්ථය තුළ ලියාපදිංචි සමුපකාර සමිතියක් විසින් හෝ එම සංගමය වෙනුවෙන් හෝ එම සංගමය සඳහා ක්‍රියාත්මක කරන ලද යම් සාධන පත්‍රයක් ; | 1465/20 (2006.10.05) 2006.10.06.දින සිට බලපැවැත්වේ |
| 10. | 1972 අංක 05 දරන සමුපතාර සමිති නීතියේ අර්ථය තුළ ලියාපදිංචි සමුපකාර සමිතියක සාමාජිකයෙකු විසින්, එවැනි ලියාපදිංචි සමිතියක ව්‍යාපාර කටයුතු සඳහා සහ ඊට අදාළව ක්‍රියාත්මක කරන ලද යම් සාධන පත්‍රයක්; | 1465/20 (2006.10.05) 2006.10.06.දින සිට බලපැවැත්වේ |
| 11. | අන්‍යොන්‍ය ප්‍රතිලාභ ශ්‍රී ලංකාවේ අනුරූපී දූත මණ්ඩලවලට ලැබෙන්නේ නම්, යම් රාජ්‍යයක, රාජතාන්ත්‍රික දූත මණ්ඩලයකට හෝ 1996 අංක 09 දරන තානාපති වරප්‍රසාද පනතේ විධිවිධාන අදාළ වන්නා වූ යම් සංවිධානයකට, සපයන ලද යම් භාණ්ඩයන් හෝ සේවාවක් වෙනුවෙන් යම් සාධන පත්‍රයක්; | 1465/20 (2006.10.05) 2006.10.06.දින සිට බලපැවැත්වේ |
| 12. | (අ) ජීවිත හෝ වෛද්‍ය රක්ෂණ ඔප්පුවක් ; හෝ<br>(ආ) (i) සිවිල් ඉදිකිරීම් කර්මාන්තයේ දී හෝ කෘෂිකර්මාන්තයේ දී යොදාගන්නා පිරියත,යන්ත්‍ර සූත්‍ර හා උපකරණ; හෝ<br>(ii) 2009 අංක 8 දරන මෝටර්වාහන (සංශෝධන) පනතින් සංශෝධනය කරන ලද 1951 අංක 14 දරන මෝටර් වාහන පනතේ 122 වන වගන්තියේ අර්ථය තුළ මෝටර් වාහන සඳහා රියදුරු බලපත්‍ර වර්ග කිරීම අනුව, බී පන්තියට අයත් යම් මෝටර් රථයක් හෝ ද්විත්වකාර්ය වාහනයක් හැර අනෙකුත් මෝටර් වාහන; හෝ<br>සම්බන්ධයෙන් වන යම් රක්ෂණ ඔප්පුවක් | 2007/24 (2017.02.21) 200702.21 දින සිට බලපැවැත්වේ |
| 13. | ගුවන් ගමනා ගමන පනත (365 අධිකාරිය) යටතේ ලියාපදිංචි කරන ලද යම් ගුවන් යානයක් හෝ 1971 අංක 52 දරන වෙළෙඳ නාවික පනත යටතේ ලියාපදිංචි කරන ලද යම් නැවක් සම්බන්ධයෙන් වන උකස් හෝ කල්බදු ඔප්පුවක් ; | 1546/7 (2008.04.22) 2008.04.22 .දින සිට බලපැවැත්වේ |

| | | |
|---|---|---|
| 14. | 1988 අංක 30 දරන බැංකු පනත යටතේ මුදල් මණ්ඩලය වෙතින් බලපත්‍රලත් යම් වාණිජ හෝ විශේෂිත බැංකුවක්, 1988 අංක 7 දරන මූල්‍ය සමාගම් පනත යටතේ ලියාපදිංචි යම් මූල්‍ය සමාගමක් , 1972 අංක 5 දරන සමුපකාර සමිති නීතිය යටතේ ලියාපදිංචි ආයතනයක්, යම් රාජ්‍ය සංස්ථාවක් , 2006 අංක 10 හෝ 2000 අංක 38 හෝ 1979 අංක 28 හෝ 1963 අංක 04 දරන දේශීය ආදායම් පනතේ කටයුතු සඳහා කොමසාරිස් ජනරාල්වරයා විසින් අනුමත කරන ලද යම් අර්ථ සාධක අරමුදලක්, හෝ නිවාස විෂය හා ඇමතිවරයා විසින් අනුමත යම් ආයතනයක් උකස් හිමියා වන අවස්ථාවන්හිදී,<br><br>(අ) නිවසක් ඉදිකිරීම; හෝ<br><br>(ආ) නිවසක් හෝ නිවසක් ඉදිකිරීම සඳහා බිම් කොටසක් මිළට ගැනීම<br><br>සඳහා ලබාගන්නා ලද රුපියල් 3,000,000ක් හෝ ඊට අඩු ණය මුදලක් සම්බන්ධයෙන් ක්‍රියාත්මක කරන ලද උකස් ඔප්පුවක් | 1465/20 (2006.10.05) 2006.10.06.දින සිට බලපැවැත්වේ |
| 15. | 2009 අංක 8 දරන මෝටර්වාහන (සංශෝධන) පනතින් සංශෝධනය කරන ලද 1951 අංක 14 දරන මෝටර් වාහන පනතේ 122 වන වගන්තියේ අර්ථය තුළ මෝටර් වාහන සඳහා රියදුරු බලපත්‍ර වර්ග කිරීම අනුව, බී පන්තියට අයත් මෝටර් රථයක් හෝ ද්විත්වකාර්ය වාහනයක් සම්බන්ධයෙන් වන යම් මූල්‍ය කල්බදු ගිවිසුමක් හැර ,යම් දේපළක් සම්බන්ධයෙන් ක්‍රියාත්මක කරන ලද යම් මූල්‍ය කල්බදු ගිවිසුමක්; | 2007/24 (2017.02.21) 2007.02.21.දින සිට බලපැවැත්වේ |
| 16. | 2009 අංක 8 දරන මෝටර්වාහන (සංශෝධන) පනතින් සංශෝධනය කරන ලද 1951 අංක 14 දරන මෝටර් වාහන පනතේ 122 වන වගන්තියේ අර්ථය තුළ මෝටර් වාහන සඳහා රියදුරු බලපත්‍ර වර්ග කිරීම අනුව, බී පන්තියට අයත් මෝටර් රථයක් හෝ ද්විත්වකාර්ය වාහනයක් හැර යම් චංචල දේපළක් සම්බන්ධයෙන් 1982 අංක 29 දරන පාරිභෝගික ණය පනත යටතේ ඇතිකර ගත් යම් කුලී සින්නත්කර ගිවිසුමක්; | 2007/24 (2017.02.21) 2007.02.21.දින සිට බලපැවැත්වේ |
| 17. | ගොඩනැගිල්ලක් වෙනුවෙන් මසකට ගෙවිය යුතු බදු කුලී හෝ කුළී වාරිකය රුපියල් 5,000 නොඉක්මවන, බද්දට හෝ කුලියට දීම සම්බන්ධවන යම් සාධන පත්‍රයක්; | 1465/20 (2006.10.05) 2006.10.06.දින සිට බලපැවැත්වේ |
| 18. | යම් සේවා යෝජකයකු විසින් ඔහුගේ සේවා නියුක්තිකයකු වෙත ගෙවනු ලබන රුපියල් 25,000 නොඉක්මවන පාරිශ්‍රමිකය සඳහා හෝ රුපියල් 1,000කට අඩු යම් මුදලක් හෝ වෙනත් දේපළක් සඳහා, දෙන ලද ලදුපතක් හෝ නිදහස් කිරීමක් ; | 1465/20 (2006.10.05) 2006.10.06.දින සිට බලපැවැත්වේ |
| 19. | 1988 අංක 78 දරන මූල්‍ය සමාගම් පනත යටතේ ලියාපදිංචි යම් මූල්‍ය සමාගමක හෝ, 1988 අංක 30 දරන බැංකු පනත යටතේ මුදල් මණ්ඩලය වෙතින් බලපත්‍රලත් යම් වාණිජ බැංකුවක හෝ විශේෂිත බැංකුවක, හෝ 1972 අංක 5 දරන සමුපකාර සමිති නීතිය යටතේ ලියාපදිංචි ආයතනයක හෝ මුදල් තැන්පත් කිරීමේදී හෝ මුදල් ආපසු ගැනීමේදී දෙන ලද ලදුපතක් ; | 1465/20 (2006.10.05) 2006.10.06.දින සිට බලපැවැත්වේ |

| | | |
|---|---|---|
| 20. | මෙම නිදහස් කිරීම නොවේ නම්, අයකළ යුතු බද්ද ගෙවීමට ආණ්ඩුව යටත් විය යුතු අවස්ථාවලදී,, ආණ්ඩුව විසින් හෝ ආණ්ඩුව වෙනුවෙන් හෝ ආණ්ඩුවේ වාසියට ලියා අත්සන් කරන ලද යම් සාධන පත්‍රයක්; | 1465/20 (2006.10.05) 2006.10.06.දින සිට බලපැවැත්වේ |
| 21. | විකුණන ලද යම් භාණ්ඩයක් හෝ සපයන ලද සේවාවක් වෙනුවෙන් එවැනි විකිණීමක් හෝ සැපයීමක් කළ වහාම මුදල් ලබන යම් තැනැත්තෙකු විසින් දෙන ලද යම් ලදුපතක්; | 1465/20 (2006.10.05) 2006.10.06.දින සිට බලපැවැත්වේ |
| 22. | මරණ පාරිතෝෂකයක් වශයෙන් හෝ මරණය හෝ තුවාල සිදුවීම සම්බන්ධයෙන් වන්දි වශයෙන් ප්‍රාග්ධන මුදලක ආකාරයෙන් ලබන මුදලක් සඳහා දෙනු ලබන යම් ලදුපතක් ; | 1465/20 (2006.10.05) 2006.10.06.දින සිට බලපැවැත්වේ |
| 23. | විශ්‍රාම වැටුප ලැබීමේදී දෙනු ලබන යම් ලදුපතක් ; | 1465/20 (2006.10.05) 2006.10.06.දින සිට බලපැවැත්වේ |
| 24. | යම් වාණිජපත් හෝ ණයකර ; | 1465/20 (2006.10.05) 2006.10.06.දින සිට බලපැවැත්වේ |
| 25. | ප්‍රතිශ්ඨාවක් නොලැබෙන අවස්ථාවන්හිදී ආණ්ඩුව විසින් හෝ ආණ්ඩුව සඳහා හෝ වෙනුවෙන් වෙනත් යම් තැනැත්තෙකු විසින් හෝ කරන සමර්පණය කිරීමක් හෝ පැවරීමක් ; | 1465/20 (2006.10.05) 2006.10.06.දින සිට බලපැවැත්වේ |
| 26. | අධිකරණ කටයුතු වලදී ඉදිරිපත් කරනු ලබන පහත සඳහන් ලේඛණ:<br>(අ) යම් අධිකරණයක යම් නඩු කටයුතුවල දී නිල බලයෙන් නඩු පවරන හෝ නඩු පවරනු ලබන හෝ මැදිහත් වන රජයේ නිලධරයන් විසින් ඒ අධිකරණයට ඉදිරිපත් කරනු ලබන ලේඛන;<br>(ආ) යම් අධිකරණයක නඩු පවරනු ලැබූ යම් නඩු කටයුතුවල දී දිළින්දෙකු වශයෙන් නඩු පැවරීමට විත්ති වාචක ඉදිරිපත් කිරීමට හෝ මැදිහත්වීමට යථා පරිදි ඉඩ දෙන ලද යම් තැනැත්තෙකු විසින් එම අධිකරණයට ඉදිරිපත් කරනු ලබන ලේඛන;<br>(ඇ) තමා බුන්වත් තැනැත්තෙකු ලෙස ප්‍රකාශයට පමුණුවන ලෙස යම් අධිකරණයකින් ඉල්ලමින් යම් තැනැත්තෙකු විසින් එම අධිකරණයට ඉදිරිපත් කරනු ලබන ලේඛන; | 1465/20 (2006.10.05) 2006.10.06.දින සිට බලපැවැත්වේ |

| | | | |
|---|---|---|---|
| | (ඇ) | හබෙයාස් කෝප්‍රස් රිට් ආඥාවක් සඳහා කරනු ලබන ඉල්ලීමක කාර්යය පිණිස යම් අධිකරණයකට ඉදිරිපත් කරනු ලබන ලේඛන; | |
| | (ඉ) | 1978 අංක 27 දරන නීති ආධාර යටතේ සපයන ලද නීති ආධාර උපයෝගී කර ගනිමින් නඩු පවරනු ලබන, විත්ති වාචකය කරනු ලබන හෝ මැදිහත් වනු ලබන තැනැත්තෙකු ලෙස නියමිත නිලධරයෙකු විසින් සහතික කරනු ලැබූ යම් තැනැත්තෙකු විසින් හෝ වෙනුවෙන් ගොනු කරනු ලබන සියළු ලේඛන; | |
| | (ඊ) | මෝටර් වාහනයකින් සිදු වූ මරණයකින් හෝ හානියකින් හට ගන්නා යම් අලාභයක් ඉල්ලුම් කරන යම් තැනැත්තෙකු විසින් හෝ ඔහු වෙනුවෙන් යම් අධිකරණයකට ඉදිරිපත් කරන ලබන ලේඛන; | |
| | (උ) | යම් අධිකරණයකට ඉදිරිපත් කරනු ලබන මෝසම්; | |
| | (ඌ) | ඉල්ලීමක් මත හෝ සිය මෙහෙයවීමෙන්ම හෝ යම් අධිකරණයක් විසින් නිකුත් කරනු ලබන වරෙන්තු. | |
| 27. | යම් ඒකක භාර නිකුත් කිරීම, මාරු කිරීම හෝ පැවරීම සම්බන්ධයෙන් වන යම් ඒකක භාර සහතිකයක් හෝ අන්‍යෝන්‍ය අරමුදලක්; | | 1487/7 (2007.01.01) 2007.01.01.දින සිට බලපැවැත්වේ |
| 28. | 1997 අංක 6 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනත යටතේ පිහිටුවන ලද කිසියම් බැංකුවක් විසින් සෑදිය යුතු යැයි හෝ ලියා අත්සන් කරනු ලැබිය යුතු යැයි නියමිත බලය දී ඇති යම් සාධන පත්‍රයක හෝ එබඳු බැංකුවක් විසින් එම බැංකුවේ ව්‍යාපාර කටයුතු සම්බන්ධයෙන් සාදන ලද හෝ ලියා අත්සන් කරන ලද යම් සාධන බලපත්‍රයක් සහ ණයක් සඳහා වන යම් ඇපයක් සම්බන්ධයෙන් එම බැංකුවට පක්ෂව වෙනත් යම් තැනැත්තෙකු විසින් සාදන ලද හෝ ලියා අත්සන් කරන ලද යම් සාධන පත්‍රයක්; | | 1478/7 (2007.01.01) 2007.01.01.දින සිට බලපැවැත්වේ |
| 29. | ශ්‍රී ලංකා රජය වෙත නිකුත්කරනු ලබන කොටස් නිකුතුවක් සම්බන්ධයෙන් වන කොටස් සහතිකයක්; | | 1752/17 (2012.04.04) 2012.04.04 දින සිට බලපැවැත්වේ<br><br>1878/3 2014.09.01 නැවත අංකනය කිරීම |
| 30. | ශ්‍රී ලංකා රජය සතු යම් කොටසක් මාරුකිරීම හෝ පැවරීම සම්බන්ධයෙන් වන යම් කොටස් සහතිකයක්; | | 1757/4 (2012.05.09) 2012.05.09 දින සිට බලපැවැත්වේ (ගැසට් පත්‍රයේ දිනය) 1878/3 (2014.09.01) නැවත අංකනය කිරීම |

| | | |
|---|---|---|
| 31. | - සමාගම් දෙකෙහිම හිමිකම ශ්‍රී ලංකා රජය සතු වන අවස්ථාවකදී, සමාගමක් විසින් තවත් සමාගමකට, හෝ<br><br>- 2008 අංක14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග ගිවිසුමකට එළඹ ඇති සමාගමක් විසින් ශ්‍රී ලංකා රජය සතු සමාගමකට | 1778/32<br>(2012.10.04)<br>2012.10.04 දින සිට බලපැවැත්වේ |
| | මූලික නිකුතුවේදී ලබා දෙන කොටස් සහතිකය | 1878/3<br>(2014.09.01)<br>නැවත අංකනය කිරීම |
| 32. | 2011 අංක 3 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ (සංශෝධන) පනතේ 53 වැනි වගන්තිය මගින් නියම කෙරෙන පරිදි, දිගු කාලීන රක්ෂණ ව්‍යාපාර සහ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර වෙනම සමාගම් දෙකක් ලෙස වෙන්කොට හඳුනාගැනීමට අනුකූලව සහ හෝ ඒ හා සමබන්ධව රක්ෂණ සමාගමක් විසින් නිකුත් කරනු ලබන යම් කොටස් සහතිකයක්; | 1889/48<br>(2014.11.21)<br>2014.11.21 දින සිට බලපැවැත්වේ (ගැසට් පත්‍රයේ දිනය) |
| 33. | මූල්‍ය අංශ ඒකාබද්ධ ක්‍රියාවලිය යටතේ මුදල් මණ්ඩලය විසින් අනුමත කරන ලද පරිදි , 1988 අංක 30 දරන බැංකු පනත යටතේ බලපත්‍රලාභී බැංකුවක්, 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත යටතේ බලපත්‍රලාභී යම් මූල්‍ය සමාගමක් හෝ 2000 අංක 56 දරන කල්බදු සමාගම් පනත යටතේ බලපත්‍රලාභී කල්බදු සමාගමක්, ඒකාබද්ධ කිරීමේ , අත්පත් කර ගැනීමේ හෝ අන්තර්ග්‍රහණය කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් නිකුත් කරන ලද යම් කොටස් සහතිකයක්; | 1889/48<br>(2014.11.21)<br>2014.11.21 දින සිට බලපැවැත්වේ (ගැසට් පත්‍රයේ දිනය) |
| 34. | 2016 ජනවාරි 01 දිනට පසුව ආරම්භ වන යම් කාල පරිච්ඡේදයක් තුළ ඇතුළත් වූ සෑම ණය කාඩ්පතක ගනුදෙනුවක් සම්බන්ධයෙන්, යම් විදේශ ව්‍යවහාර මුදලකින් කාඩ්පතක් ඉදිරිපත් කරන හෝ ඉදිරිපත් නොකරන ගනුදෙනුවක් යන්න පිළිබඳව සැලකිල්ලට නොගෙන එහි වෙළඳ රට (භාණ්ඩ හෝ සේවා මිළදී ගැනීම හෝ මුදල් ආපසු ගැනීම් සිදුවන රට) ශ්‍රී ලංකාව වන අවස්ථාවක දී ගෙවිය යුතු වන යම් මුදල් ප්‍රමාණයක් ගෙවීම සඳහා හිමිකම් පෑමක්, ඉල්ලීමක් හෝ අයැදීමක්; | 1947/46<br>(2016.01.01)<br>2016.01.01 දින සිට බලපැවැත්වේ (ගැසට් පත්‍රයේ දිනය) |
| 35. | යම් සමාගමක යම් කොටස් සංඛ්‍යාවක් නිකුත් කිරීමක්, මාරු කිරීමක් හෝ පැවරීමක් මත නිකුත් කළ යම් කොටස් සහතිකයක්; | 1947/46<br>2016.01.01<br>2014.11.21 දින සිට බලපැවැත්වේ (ගැසට් පත්‍රයේ දිනය) |
| 36. | රජය විසින් හෝ රජය වෙනුවෙන් යම් තැනැත්තෙකු විසින් හෝ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන නීතිය යටතේ ස්ථාපනය කරන ලද නාගරික සංවර්ධන අධිකාරිය විසින්, යම් ඉඩමක් කල් බදු දීමේදී, රජය පාර්ශවයක් වන ගිවිසුමකට අනුව බදු ගැනුම්කරු විසින් කල් බදු වාරික ගෙවීම සහ/ හෝ බදු කුළිය/ ප්‍රතිෂ්ඨාව අදාළ | 2149/18<br>2019.11.14 |

| | |
|---|---|
| වන පරිදි, රජයට හෝ එකී නාගරික සංවර්ධන අධිකාරියට මුදලින් ගෙවිය යුතු නොවන අවස්ථාවක, එකී කල් බදු දීමට අදාළ සාධන පත්‍රය; | 2019.11.14 දින සිට බලපැවැත්වේ (ගැසට් පත්‍රයේ දිනය) |

## ඇමතුම් තොරතුරු - වැඩිදුර තොරතුරු සඳහා පහත දුරකථන අංක අමතන්න

| | |
|---|---|
| මුද්දර ගාස්තු අංශය | 0112135179<br>0112135174<br>0112135137<br>0112135139<br>0112135171 |
| ලේකම් අංශය | 0112135435<br>0112135434<br>0112135412 |